**ශීර්ෂය 417 - වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

**-------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 20 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **අත්තිකාරම් ලැබීම්**<br>SA 52 අනුව අත්තිකාරම් ලැබීම් වල එකතුව රු.8,684,240 ක් වුවද රු. 8,955,958 ක් ලෙස දක්වා තිබීම නිසා අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 271,718 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 271,718 ක ශේෂය අඩු වීමක් දක්නට ලැබෙන්නේ අත්තිකාරම් ගිණුම 417012 වැය ශීර්ෂ 267 යටතේ 2020 මාර්තු මස රු.143,400 කරන ලද හර කිරිම හා වැය ශීර්ෂ 269 යටතේ 2020 ජුනි මස රු 128,318 කරන ලද හර කිරිම හේතුවෙන් බව දැනුම් දෙමි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | ගිණුම් අංශය මගින් ඉදිරිපත් කරන ලද මාසික ගිණුම් සාරාංශයෙහි වෙනත් ලැබීම් (230099)ලෙස නිවාස ණය නැවත අයකර ගැනීම දක්වා ඇති අතර එහි මූල්‍යම ලැබීම් රු.9,192,895ක් හා හරස් සටහන් මඟින් රු.7,565,041ක් වශයෙන් මුළු එකතුව රු.16,757,936ක් රජයේ ආදායමට බැර කර තිබුණි. එහෙත් අංක SMEHCI/03/Gov.Audit/GEN/2021-(ii)/(02 හා 2021 අප්‍රේල් 08 දිනැති අතිරේක ලේකම් (සංවර්ධන)ලිපිය අනුව මුළු අයකිරීම් රු.7,782,538ක් බව දක්වා තිබීම හේතුවෙන් රු.8,975,398ක වෙනසක් නිරීක්ෂණය විය. | පිලිතුරු ලබා දී නොමැත. | ණය අයකර ගැනීම් සම්බන්ධ තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් සැසඳීමේදී ඒසීඒ-6 ආකෘතිය අනුව දේපළ, පිරියත හා උපකරණ වල ඇතුලත් අංක 6112201 යටතේ වර්ෂය තුල මිලදී ගැනීම් රු.500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ සංචිත ගිණුමේ ශේෂයද එම වටිනාකමින් වැඩියෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | රු.500,000 ක් වන අතිරේක ශේෂය සඳහා හේතුව වන්නේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් දැනුම් දීමකින් තොරව ලබා දී ඇති මුදලක් බව දැනුම් දෙමි. මෙම වරද නිවැරදි කිරීමට අදාල ලිපි අදාල අංශ වෙත යොමු කර ඇත. | නිවැරදි අයුරින් තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අමාත්‍යාංශයේ වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයයන් වලින් වර්ෂය තුලදී දරා තිබූ වියදම රු. 3,704,616 ක් වුවද මූල්‍ය ප්‍රකාශ වල ඒසීඒ 6 ආකෘතිය අනුව වර්ෂයේ මිලදී ගැනීම් ලෙස රු. 3,140,716 ක්ද හා භාණ්ඩාගාර මුල්‍ය නොවන වත්කම් සාරාංශ වාර්තාව අනුව මිලදී ගැනීම් ලෙස රු. 2,640,716 ක් ද වශයෙන් දක්වා තිබුණි. | පිලිතුරු ලබා දී නොමැත. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

1.6.3 **අත්තිකාරම් ගිණුම් ශේෂ**

**----------------------------**

අත්තිකාරම් ගිණුමවල වර්ෂ අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) SA 52 අනුව අත්තිකාරම් ගෙවීම් රු.41,612,297 ක් වුවද රු. 6,660,541 ක් ලෙස මුල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු. 40,945,756 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂ අවසානයේ භාණ්ඩාගාර මුද්‍රිත ගිණුම් වාර්තා වලට අනුකූලව හා අමාත්‍යාංශය විසින් සකස් කළ වර්ෂ අවසාන ගිණුම් වාර්තා අනුව අමාත්‍යාංශයට අදාළ අත්තිකාරම් ගෙවීම් වල එකතුව රු.6,660,541 යන අගය නිවැරදි වන අතර මෙම අගයන් සමාන වූ බවද දැනුම් දෙමි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් තොරතුරු ඉදිරිපත් කල යුතුය. |
| (ආ) භාණ්ඩාගාර පොත් අනුව වර්ෂය තුල හර කිරීම් රු.35,636,499 ක් හා බැර කිරීම් රු. 1,557,251 ක් වුවද ඒසීඒ-5 අත්තිකාරම් ගිණුමට අදාල අංක 8493/0/0/0417/0/012 යටතේ වර්ෂය තුල හර කිරීම් ලෙස රු.684,743 ක් හා බැර කිරීම් ලෙස රු. 1,828,969 ක් දක්වා තිබුණි. | පිලිතුරු ලබා දී නොමැත. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

**1.6.4** **අග්‍රිම ශේෂය**

**---------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඒසීඒ - 3 යටතේ අග්‍රිම ගිණුම තුල අග්‍රිම ලැබීම් යටතේ වෙනත් මූලාශ්‍ර වලින් ලැබීම් ලෙස රු.27,939,559 ක් දැක්විය යුතු වුවත් රු.28,793,782 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.854,223 ක් වැඩියෙන් දක්වා තිබූ බව | පිලිතුරු ලබා දී නොමැත. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් පදනම් කර ගනිමින් නිවැරදි අයුරින් තොරතුරු ඇතුලත් කල යුතුය. |

නිරීක්ෂණය විය. එම වැඩිවීම මාසික ගිණුම් සාරාංශය තුල ජූලි මස වෙනත් මූලාශ්‍ර වලින් ලැබීම් වැඩියෙන් සටහන් වී ඇති බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

------------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මුළු ප්‍රතිපාදන ඉතිරිවීම.** 417-01-01-2002 දරන මූලධන වැය විෂය වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදනය රු. 925,000 ක් වූ අතර එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | අවසන් කාර්තුව සඳහා අයවැය ඇස්තමේන්තුව සකස් කිරිමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වැරදීමකින් 417-01-01-2003 වැය විෂයට අදාල වියදම මෙම වැය විෂයට එකතු කිරිමෙන් ඇති වූ ඉතිරියකි. | වෙනස්වීම් සොයා බලා නිවැරදි ආකාරයට ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. |
| (ආ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරිමේදී වැය විෂයන් 09 ක විචලතාවය ඍණ සියයට 100 සිට ධන සියයට 21 අතර පරාසයක් තුළ වෙනස් වී තිබුණි. | පිලිතුරු ලබා දී නොමැත. | අදාල ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි අයුරින් පිළියෙල කල යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

----------------------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල සටහන් කර නොතිබූ 2020 වර්ෂයට අදාල බැරකම් රු. 6,672,415 ක්, 2021 වර්ෂය තුලදී ගෙවා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී එසේ සිදු නොවන මෙන් කටයුතු කරන මෙන් අදාල නිලධාරින් දැනුවත් කරන ලදී | ප්‍රවර්තන වර්ෂයට අදාල සියළු බැරකම් , බැරකම් පිළිබඳ ප්‍රකාශයට නිවැරදි ලෙස ඇතුලත් කල යුතුය. |
| (ආ) | වැය විෂයන් 11 ක ඉතිරිවීම් සැලකිල්ලට නොගෙන රු. 6,085,170 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා බැදීම් ඇතිකරගෙන තිබුණි. | පිලිතුරු ලබා දී නොමැත. | ප්‍රවර්තන වර්ෂයට අදාල බැරකම් සම්බන්ධයෙන් බැදීම් ඇතිකර ගැනීමේදී අදාල වැය විෂයන් වල ඉතිරිවීම් සම්බන්ධයෙන් සැලකිලිමත්ව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විගණනයට ඉදිරිපත් කර තිබූ බැරකම් ලේඛනයේ සිගාස් පිටපත තුල නොමැති රු.1,137,489 ක බැරකම්, බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් 2020 වර්ෂ අවසානයේදී CIGAS පරිගණක වැඩසටහන යාවත්කාලීන කර ඇත. එම යාවත්කාලීන කිරිමේදි අපගේ අමාත්‍යාංශයට අදාල බැරකම් ලේඛනයේ රු.1,137,489 ක් වටිනා අයිතම කිපයක් මගහැරී ගොස් ඇත. පසුව අප විසින් එය නිරික්ෂණය කොට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී නැවත බැරකම් ලේඛනයට එකතු කොට ඇත | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට නිවැරදි ලෙස තොරතුරු ඇතුලත් කල යුතුය. |

**2.3**

**රජ**
**යේ**
**නිල**
**ධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයෙන් මාරු වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 258,250 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 මාර්තු 22 වන විටත් ගෙන නොතිබුණි. | ස්ථාන මාරු වී යන නිලධාරීන් සම්බන්ධයෙන් නව සේවා ස්ථානය වෙත දැනුම් දී අදාල ණය ශේෂයන් පියවා ගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සේවයෙන් ඉවත් වූ හෝ වැඩ තහනම් කරන ලද සේවකයින්ගෙන් ලැබිය යුතු වර්ෂ 02 ත් 04 ත් අතර කාලයක සිට පැවත එන රු .326,582 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XVIV පරිච්ඡේදයේ 4:6 වගන්තිය පරිදි නෛතික ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී. | -එම- |
| (ඇ) | සේවය අතහැර ගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 60,630 ක ණය ශේෂ වර්ෂ 02 කට අධික කාලයක සිට අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් වල වියදමේ උපරිම සීමාව රු. 23,700,000 ක් වුවත් වර්ෂය තුල මුළු වියදම රු.5,975,798 ක් හෙවත් සියයට 25 ක් පමණක් විය. | ප්‍රතිපාදනයන් ලැබීම් සිදු වුයේ කාර්තුමය වශයෙන් වන අතර ප්‍රතිපාදනයන් ඉතිරි වුවද ඉදිරි කාර්තුන් සඳහා එම මුදල් භාවිතා කිරිමට නොහැකි බැවින් ප්‍රතිපාදන ඉතිරි වූ බව දැනුම් දෙමි. | අත්තිකාරම් ගිණුම්වල සීමාවන් පිළිබඳව සැලකිල්ලකින් යුතුව අත්තිකාරම් ගිණුම් කටයුතු මෙහෙයවිය යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) | මහජනයාට දෙන ණය මුදල්, සම්පූර්ණ මුදලම ආපසු අයකර ගැනීම සහතිකවීම සඳහා ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතු කර ගැනීමටත්, අදාල කාර්යයෙහි සතුටුදායක ප්‍රගතියක් අත්කර ගැනීම සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කිරීමටත් අදාල සියළුම ගණුදෙනු සටහන් කර තබා ගැනීමට විධිමත් ණය ලේඛනයක් පවත්වා ගැනීමටත් කටයුතු කර නොතිබීම. | පිලිතුරු ලබා දී නොමැත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 571 (3) | 6000-0-0-13-0088-0 තැන්පතු ගිණුමේ දක්වා ඇති රු.452,776 ක වටිනාකම සම්බන්ධයෙන් අදාල ගිණුමට හෝ රජයේ අදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2017/04/11 දින මසක් ඇතුළත ඉල්ලීම් නොකරන්නේ නම් රජයේ ආදායමට බැර කරන බවට තැන්පතු හිමියාට දැනුම් දීම සඳහා කටයුතු කරන ලදී. | -එම- |
| | අංක 6000-0-0-16-0082-0 දරන තැන්පතු ගිණුමේ දක්වා ඇති රු.47,075,764 ක වටිනාකම සම්බන්ධයෙන් අදාල ගිණුමට හෝ රජයේ අදායමට බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | රු.6,559 ක් 2021 වර්ෂයේ රජයේ ආදායමට බැර කිරීමටත් රු. 2,924 ක් ගෙවීම් කිරීම සඳහා සූදානම් කිරීමටත් රු.6,396 ක තැන්පතුවක් අදාල ආයතනය වෙත ප්‍රේෂණය කරන ලෙස දැන්වීමටත් රු. 40,416 ක තැන්පතුවක් තැන්පතුහිමියා ඉල්ලීම් නොකරන්නේනම් රජයේ ආදායමට බැර කරන බවට දන්වා යැවීමටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඉතිරිය පසුගිය වර්ෂවල ආරම්භ කර වැඩ අවසන් වී නොමැති ඉදිකිරීම් ව්‍යාපෘති වල ගෙවීම් වලට අදාලව අඩු කරන ලද රඳවාගැනීම් මුදල් වන අතර ඒවා නිරවුල් කිරීමේ පසුවිපරම් කටයුතු සිදුකෙරෙමින් පවතී. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | මූලික පරීක්ෂණයෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මාසයක් ඇතුලත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් අනතුරු සිදු වූ අංක PH – 0177, PG – 1440 හා CAR – 5030 යන වාහන සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අවශ්‍යවන පොලිස් වාර්තා ප්‍රමාදවීම මත පූර්ණ වාර්තාව ලබා දීම ප්‍රමාද වී ඇති අතර, මෙම පූර්ණ වාර්තා මාස 03 ක් තුල ලබාදීමට සටහන් කර ගතිමි. | -එම- |
| (iv) මුදල් රෙගුලාසි 104(4), 106(3) හා 109(1) | - 2015 වර්ෂයේ අනතුරට ලක්වූ අංක CAJ- 4341 හා JY-2971 යන වාහන සම්බන්ධයෙන් වූ | අලාභ හානි පූර්ණය සඳහා ප්‍රතිපාදන ලෙස රු.100,000.00 ක මුදලක් 2021 වර්ෂය සඳහා වන අයවැයෙන් වෙන්කොට ලබා දී ඇත. JY-2971 කැබ් රථයේ අලාභය වන රු68,641 | -එම- |

| | | | |
|---|---|---|---|
| | පාඩුව 2020 දෙසැම්බර් 31 දින දක්වා භාණ්ඩාගාරයේ මුදල් වෙන් කරවා ගිණුමෙන් කපා හැරීමට කට යුතු කර නොතිබුණි. | පොත් වලින් දැනටමත් කපා හැරීම සිදු කර ඇති බැවින් එම අලාභය ගිණුම් ගත කිරීම හා CAJ- 4341 කාර් රථය සඳහා වන අලාභය රු.14,450 පොත් වලින් කපා හැර ගිණුම් ගත කිරීමට කඩිනමින් කටයුතු කරන බව දැනුම් දෙමි. | |
| - | ලිපිකරු මේස දෙකක් නැතිවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින දක්වා එසේ කටයුතු කර නොතිබුණි. | අලාභය රු.25,935.00 ක් ලෙස හඳුනාගෙන ඇති අතර එම අලාභය පොත් වලින් කපා හැරීම සඳහා කමිටුවක් පත් කර මූලික පරීක්ෂණයෙන් අනතුරුව මුදල් රෙගුලාසි 104(4), 106(3) හා 109(1) ප්‍රකාරව කටයුතු කරන බව දැනුම් දෙමි. | -එම- |
| - | තුන්වන පාර්ශවීය රක්ෂණය පමණක් සිදුකර ඇති අංක JY – 2916 දරන වාහනයට සිදුවූ අනතුරක් හේතුවෙන් වැය කර තිබූ රු.1,032,130 ක මුදල නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් හා රියදුරුගෙන් අයගෙන් අයකර ගැනීමට නිර්දේශය කර ඇතත් 2020 දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | අංක JY – 2916 දරණ වාහනයේ හදිසි අනතුරින් සිදු වූ අලාභය වන රු .1,032, 130 මුදල රියදුරුගෙන් අය කර ගැනීමට ලිපි නිකුත් කර ඇත. රියදුරු එම ලිපිනයේ පදිංචිව නොමැති බැවින් ලිපිය නැවත අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. එහෙත්, මෙම රියදුරු දැනට අමාත්‍යාංශයේ සේවයේ නොයෙදෙන අතර, මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි. | -එම- |
| | | අංක KB -9614 දරණ වාහනය හදිසි අනතුරින් පසුව සිදුවූ අලාභය වන රු. 89,759 ක මුදල ගෙවීම් කරන ලෙස අවස්ථා 03 කදී දැනුම් දී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | - අංක KB -9614 යන වාහනයට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් සිදුවී ඇති හානියෙන් රු.89,759 ක රජයට සිදු වූ පාඩුව රියදුරු මහතාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය කාර්යමණ්ඩලයට අනුයුක්තව සේවයේ නියුතුව සිටි මෙම රියදුරු දැනට අමාත්‍යාංශයේ සේවයේ නොයෙදෙන අතර, මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. | |
| (v) මුදල් රෙගුලාසි 702 | වැව්ලි මානව සංවර්ධන භාරයට (පීඑච්ඩීටී) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී නීතිපතිවරයා විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රවල අත්සන් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. | වැව්ලි මානව සංවර්ධන භාරය 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පිටු අංක 19 **A, 20 A** මගින් අමාත්‍යාංශය යටතේ වන ආයතනයක් ලෙස ගැසට් කර ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වැව්ලි මානව සංවර්ධන භාරයට අනුමැතිය ලබා දීම සිදු කරනු ලැබේ | -එම- |
| (vi) මුදල් රෙගුලාසි 702(3) | අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද සියලුම කොන්ත්‍රාත්තු වල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | ''වැව්ලි මානව සංවර්ධන භාරය'' විසින් අදාළ වතු සමූපකාර සමිති සමග එළඹි කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් ඉදිරියේදී විගණනය සඳහා ලබා දීමට කටයුතු කරමි. මෙම අමාත්‍යාංශයට අදාල සෘජුව ඇති කොන්ත්‍රාත් ගිවිසුම් වල පිටපත් ද විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | -එම- |
| (vii) මුදල් රෙගුලාසි 237 (අ) (iii) | රු.5,149,696 ක රදවා ගැනීමේ මුදල් අදාල අධිකාරියේ සැලකිල්ලකින් තොරව වැව්ලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවා තිබුණි<br><br>මහනුවර මාර්ග ව්‍යාපෘති සඳහා ආයතනයක් වෙත අවසාන බිල්පත් වටිනාකම ලෙස රදවා ගැනීමේ මුදල් අඩු කිරීමකින් තොරව | සංවර්ධන ව්‍යාපෘති අදියරයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ''වැව්ලි මානව සංවර්ධන භාරය'' විසින් අමාත්‍යාංශය වෙත බිල්පත් යොමු කරනු ලබන අතර, ඉන් පසු අමාත්‍යාංශයීය තාක්ෂණික නිලධාරීන් විසින්, ඉටු කරන ලද වැඩ අධීක්ෂණය කිරීමෙන් පසු, අමාත්‍යාංශයීය උපදේශක ඉංජිනේරු හා ව්‍යාපෘති ඉංජිනේරු විසින් කරනු ලබන නිර්දේශය මත පමණක් වර්තමානයේදී ගෙවීම් සිදු කරනු ලබයි. ඉදිරියේදී ද ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව වාර්තා කරමි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.86,620 ක් ගෙවා තිබුණි. | | |
| | (viii) මුදල් රෙගුලාස 756 , 757 හා 1647 (ආ) | වාහන හා අමතර උපකරණ ද පිළිබඳව වාර්ෂික සමීක්ෂණ පැවැත්විය යුතු අතර වාහනයක භාරය වෙනස් කල සෑම අවස්ථාවකදීම වාහනයේ ආරක්ෂාව භාරදෙනු ලැබූ වහාම එවැනි සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් 2016 සිට 2020 දක්වාම එසේ සිදුකර නොතිබුණි. | මේවන විට අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය විසින් අදාළ තොරතුරු ගිණුම් අංශය වෙත යොමු කරඇති අතර වාහන සමීක්ෂණය සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | -එම- |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.31 ජේදය | අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා ඉන්ධන පරීක්ෂාවක් කර නොතිබුණි. | හැකි ඉක්මනින් මෙම කාර්යය සම්පූර්ණ කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | අංක 2/2018 දරන 2018 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන ජේදය හා 6 ජේදය | චක්‍රිය අරමුදල ඇතුළු අරමුදල් 13 ක් වසා දැමීමටත් චක්‍රීය අරමුදලට අයවිය යුතු ණය අයකර ගැනීමටත් 2020 දෙසැම්බර් 31 දක්වාම කටයුතු සිදු කර නොතිබුණි. | පිලිතුරු ලබා දී නොමැත. | -එම- |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාණ්ඩලික නොවන නිලධාරියෙකුට උපරිම සීමාව සැලකිල්ලට නොගෙන රු. 133,000 ක් ලබාදී තිබූ අතර තවත් නිලධාරිනියක් හට ලබා දුන් රු 68,300 ක අත්තිකාරම අදාළ කාර්යය අවසන් වී දින 107 ක් හා දින 112 ක් ප්‍රමාද වී පියවා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදි නිලධාරීන් හට අත්තිකාරම් ලබා දීමේදී විශේෂ සැලකිල්ලක් යොමු කොට කටයුතු කරන ලෙසත් නිසි කලට අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කරන ලෙස අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | අත්තිකාරම් නිකුත් කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව පාලනයකින් යුතුව කටයුතු කල යුතුය. |
| (ආ) නිලධාරින් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබුණු රු. 20,000 ක හා රු. 112,500 ක අත්තිකාරම් දින 173 ක් හා දින 143 ක කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) අතුරු අග්‍රිමයක් ලෙස මාක්ෆෙඩ් ආයතනයේ නිලධාරියෙකු හට ඉන්ධන වෙනුවෙන් රු. 200,000 ක අත්තිකාරමක්ද වෙනත් ආයතනයක් වෙත රු. 100,000 ක අත්තිකාරමක්ද නිකුත්කර තිබූ අතර එම අත්තිකාරම දින 243 ක් ප්‍රමාද වී පියවා තිබුණි. | -එම- | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 සැලැසුම් කිරීම

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු වර්ෂයේ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. | යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය හා නිත්‍ය කාර්යමණ්ඩල විස්තර, විගණකාධිපති වෙත යොමුකරන ලද 2020 ක්‍රියාකාරී සැලැස්ම හා 2020 කාර්යසාධන වාර්තාව සමඟ යොමුකර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වූ වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීමත්, ඉදිකිරීම් සම්පූර්ණ කරන ලද නිවාස ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කිරීමත් යන කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී අවධානය යොමුවී නොතිබුණි. | වැවිලි ප්‍රජාව සඳහා ජන මූල මණ්ඩල හා ජන මූල සභා පිහිටුවීම 2021.10.06 දින ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ප්‍රජා ජන මූල මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා මේ වන විට කෙටුම්පත් සම්පාදනය කර ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන් දැනුවත් කර මූලික කටයුතු සිදුකර ඇත. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ නිසි අවධානයකින් යුතුව පිළියෙල කල යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**---------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම තුළ නව ජීවන නිවාස වැඩසටහනෙහි නව නිවාස ඒකක 150 ක් බිත්ති මට්ටම දක්වා ඉදිකිරීමට සැලසුම් කර තිබුණද 2020 දෙසැම්බර් 31 දිනට කිසිදු නිවාසයක වැඩ ආරම්භ කර නොතිබුණි. හැටන් කලාපයේ නිවාස 91 ක් හා නුවරඑළිය කලාපයේ නිවාස 47 ක් සඳහා වැඩ ආරම්භකිරීමේ වියදම් හා වැවිලි මානව සංවර්ධන භාරය වෙත කළමනාකරණ ගාස්තු ලෙස එකතුව රු.27,840,000 ක් ගෙවීම් කර තිබුණි.වර්ෂය ආරම්භයේදී සැලසුම් කර තිබුණු මෙම කාර්යය සඳහා මුදල් ලබා දී තිබුණේ දෙසැම්බර් මස වීම හේතුවෙන් කිසිදු කාර්යයක් ඉටු වී නොතිබුණි. | පැවති කෝවිඩ් 19 තත්වය හේතුවෙන් එම මූලික කටයුතු රාශියක් අපේක්ෂිත ලෙස ඉටුකර ගැනීමට නොහැකි විය. මුදල් ඉල්ලීම වර්ෂය අවසානය දක්වා ප්‍රමාද වූ නිසා වර්ෂය අවසානයේ මුදල් නිදහස් කිරීමට සිදුවිය. | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව 2020 ජූනි 30 දිනට නිමකිරීමට අපේක්ෂිත අවිච්ඡේද නිවාස සංඛ්‍යාව 1710 ක් විය. රු.මිලියන 680.79 ක් වැය කරමින් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිමකරන ලද නිවාස ප්‍රමාණය 700 ක් වූ අතර එය අපේක්ෂිත නිමවුම් මට්ටමෙන් සියයට 40.9 ක භෞතික ප්‍රගතියක් බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත භෞතික ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවූ නමුත් ඒ වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව 100 % මූල්‍ය ප්‍රගතිය අත්කර ඇත. එසේ නමුත් පැවැති කොවිඩ් වසංගත තත්වය හමුවේ ද සංචරණ සීමා පැනවීම් යනාදිය නිසා ඉදිකිරීම් කටයුතුවල තිබුණු ප්‍රමාදයන් හේතුවෙන් සහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරනු ලබන කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යයසාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී වැඩසටහන් 03 ක් යටතේ ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක වූ අතර ව්‍යාපෘති 09 ක භෞතික ප්‍රගතිය සියයට 1.7 සිට සියයට 58.58 අතර වූ බව නිරීක්ෂණය විය. | පැවැති කොවිඩ් නීති රීති වලට අනුව දැනුවත් කිරීමේ වැඩ සටහන් ප්‍රජා පුහුණු වැඩ සටහන් පැවැත්වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කරගත නොහැකි විය | -එම- |
| (ඇ) | ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 108.87 ක ප්‍රතිපාදන ලැබී තිබුණද තත්‍ය වියදම රු.මිලියන 68.73 ක් වූයෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 63.13 කි. ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය උප ව්‍යාපෘතිය සඳහා ඉලක්ක ස්ථාපිත කර නොතිබූ අතර අනෙකුත් ව්‍යාපෘතීන්හි භෞතික ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය සියයට 1 සිට සියයට 1.7 දක්වා වූ අවම මට්ටමක පැවතුණි. | වෙන්කරන ලද රු.මි. 108.87 කින් රු.මි. 60 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2020.09.30 දින අතුරු සම්මත ගිණුමට වෙන් කිරීම හේතුවෙන් අපේක්ෂිත පරිදි වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ අනුව ප්‍රමාද වී ආරම්භ කළ වැඩසටහන් 2021 වර්ෂය සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර මෙම වර්ෂය තුල නිම කිරීමට අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘති සම්බන්ධයෙන් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ඉන්දියානු ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතියෙහි නිවාස ඒකක 1890ක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණද නිවාස ඒකක 1466ක් පමණක් සම්පූර්ණ කර තිබූ අතර කිසිදු නිවාසයක් ප්‍රතිලාභීන් වෙත පවරා දී නොතිබුණි. | ඉන්දියානු ආධාර ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම සඳහා 2020 ප්‍රතිපාදන වෙන්වී නොතිබුණු බැවින් නිවාස සඳහා යටිතල පහසුකම් සැපයීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් නිවාස ප්‍රතිලාභීන් වෙත පැවරීමට හැකියාවක් නොලැබුණි. | සම්පූර්ණ කර අදාල ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු කල යුතුය. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | චක්‍රීය අරමුදලක් ඇති කර ණය ලබා දී තිබූ අතර පලමුවන අධියර යටතේ අරමුදල ආරම්භ කල දින සිට 2010 වර්ෂය දක්වා රු.9,210,760 ක ණය ලබා දී තිබුණි. 2013 ජනවාරි 30 දක්වා ඉන් රු.4,223,343 ක් පමණක් එකතු කර තිබූ අතර ඉතිරි මුදල චක්‍රීය අරමුදලට කපා හැර තිබුණි. දෙවන අධියර යටතේ 2016 ජනවාරි 26 දිනට පැවති ශේෂය වූ රු.8,758,443 ක චක්‍රීය අරමුදල සඳහා ලංකා බැංකුව සමග නව ගිවිසුමක් අත්සන් කර ප්‍රතිලාභීන් වෙත ණය ලබාදී තිබූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ලබාදුන ණය මුදල නැවත අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි වේ. | පිළිගනිමි.<br><br>චක්‍රීය අරමුදලේ ප්‍රතිලාභීන් 35 දෙනාගෙන් ප්‍රතිලාභීන් 28 දෙනෙකු මේ වන විට ණය මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇත. ප්‍රතිලාභීන් 4 දෙනෙකු ණය වාරික ගෙවමින් පවතින අතර, ප්‍රතිලාභීන් තිදෙනෙකු ණය වාරික ගෙවීම පැහැර හැර ඇත. ණය ගෙවීම පැහැර හැර ඇති ප්‍රතිලාභීන්ගෙන් ණය මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස වැවිලි ප්‍රජා සන්නිවේදන | චක්‍රීය අරමුදලේ කටයුතු නිසි අධීක්ෂණයකින් හා පාලනයකින් යුතුව ඉටු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (i) 2016 අගෝස්තු මාසයේදී ප්‍රථම වටය යටතේ ණය ලබාදුන් ප්‍රතිලාභීන් දෙදෙනෙකුගෙන් රු.183,466 ක ශේෂයක් අයවී නොතිබුණි. | පහසුකම් සලසන්නා නිලධාරින් දැනුවත් කර ඇත. | |
| | (ii) 2017 වර්ෂයේ දෙවැනි වටය යටතේ ණය ලබා දී තිබුණු ප්‍රතිලාභින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 120,297 ක් හිඟවී පැවතුණි. | | |
| | (iii) 2016 වර්ෂයේ ණය ලබාදුන් ප්‍රතිලාභීන් 3 දෙනෙකු අදාළ ණය මුදල ලබාගත් කාර්යයට යොදවා නොමැති බවත් ඒ සම්බන්ධව 2020 දෙසැම්බර් 31 දක්වාම අමාත්‍යාංශය ප්‍රමාණවත් ක්‍රියාමර්ගයන් ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | | |
| (ආ) | අමාත්‍යාංශය විසින් වැවිලි ක්ෂේත්‍රයේ සැමට මූලික යටිතල පහසුකම් සහිත සුරක්ෂිත නිවාස හා වාසස්ථාන හිමිකරදීමේ ප්‍රධාන අරමුණින් ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි වේ.අ<br><br>(i) හරිත රන් නිවාස වැඩසටහන යටතේ 2020 දෙසැම්බර් 31 දිනට නිවාස ඒකක 4007 ක් සම්පූර්ණ කර තිබුණද ප්‍රතිලාභීන් වෙත ප්‍රධානය කර තිබුණේ ඉන් නිවාස ඒකක 2225 ක් පමණක් වූ අතර එය සම්පූර්ණ කරන ලද ප්‍රමාණයෙන් සියයට 55 කි. 2016, 2017 හා 2018 යන වර්ෂ වලදී යටිතල පහසුකම් සහිතව සම්පූර්ණ කරන ලද නිවාස 177 ක් ද යටිතල පහසුකම් රහිතව සම්පූර්ණ කරන ලද නිවාස 574 ක් ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර නොතිබුණි.<br><br>(ii) 2018 වර්ෂයෙන් පසු කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණ කරන ලද නිවාස ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර නොතිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද වාර්තා අනුව නිරීක්ෂණය විය. | පිළිගනිමි.<br><br>විවිධ හේතූන් පවසා ප්‍රතිලාභීන් මෙම නිවාස භාර ගැනීමට ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිලාභීන් වෙත භාර දීමට නොහැකි වී ඇති අතර ප්‍රතිලාභීන් වෙත භාර නොදුන් නිවාස පිළිබඳ තොරතුරු සොයා බලා, ඒවා නිවාස අවශ්‍යතාවය සහිත වෙනත් ප්‍රතිලාභීන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | නිවාස ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගැනීමට උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශය විසින් 2015,2016,2017 හා 2018 වර්ෂවලදී කලාප 07ක වතු 55ක් ආවරණය කරමින් රු.292,025,000ක් වටිනා නිවාස ඒකක 1159 ප්‍රතිලාභීන් වෙත ණය පදනම මත ලබා දී තිබුණි.ඉන් නිවාස ඒකක 282ක් වෙනුවෙන් අයවිය යුතු රු.77,550,000න් කිසිදු මුදලක් 2020 දෙසැම්බර් 31 වන විටත් අයකරගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී මේ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරමි. | නිවාස වෙනුවෙන් අයවිය යුතු මුදල් ඉක්මණික්ම අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දිනට අයකරගෙන තිබූ මුළු මුදල රු.73,070,941ක් වූ අතර එය මුළු ණය මුදලින් සියයට 25.02ක අවම මට්ටමක පැවතුණි. | පිලිතුරු ලබා දී නොමැත. | ණය මුදල් අයකර ගැනීම සඳහා උපරිම කාර්යක්ෂමතවය කින් යුතුව කටයුතු කල යුතුය. |

**3.5** **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

--------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හරිත රන් නිවාස ව්‍යාපෘතිය යටතේ 2016,2017 හා 2018 වර්ෂවල අවිච්ඡේදව පැවති නිවාස ඒකක 1026 ක ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී අත්හිටුවා ඇති බව ප්‍රගති වාර්තාවෙහි දක්වා තිබූ අතර නිවාස ඒකක 482ක් වෙනුවෙන් වැඩ ආරම්භකිරීමේ පිරිවැය රු.67,120,000 ක් ගෙවීම් කර තිබුණි.මෙම මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි | ගෙවීම් කල මුදල්, නව ව්‍යාපෘති සඳහා ගෙවීමට ඉදිරිපත් කරන ලද බිල්පත් වෙනුවෙන් ආවරණය කර ගන්නා ලදි | අමාත්‍යාංශට අයවිය යුතු මුදල් ඉක්මණින්ම අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 හා 2018 වර්ෂ වල කෑගල්ල හා ගාල්ල කලාපයන්හි පිළිවෙලින් නිවාස ඒකක 45 ක් හා 8 ක් ඉදිකිරිම වෙනුවෙන් මූලික වැඩ කොටස් සඳහා සියයට 20 ක අත්තිකාරම් හා කළමනාකරන ගාස්තු ලෙස රු.3,770,000 ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.ඒ අනුව ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදය වර්ෂ 03 ඉක්මවා තිබූ අතර එම කාර්යයන් ඉටු නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2015-2019 වර්ෂයන්හි දී වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇතත්, වර්ෂය සඳහා අමාත්‍යාංශයට වෙන්වී ඇති ප්‍රතිපාදනවලින් වියදම් සිදු කරන ලෙස දන්වා ඇත. එහෙත් මෙම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වර්ෂයේ ප්‍රතිපාදන යොදා ගන්නා බැවින් අතිරේක ප්‍රතිපාදන ලැබෙන තෙක් උක්ත වියාපෘතිවල ගෙවීම් කටයුතු අත්හිටුවා ඇත. එම හේතුවෙන් පසුගිය වර්ෂවල වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘති අදාල කාලයන් තුල සම්පූර්ණ කිරීමට කටයුතු සම්පාදනය කල යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද හැටන්, නුවරඑළිය, මහනුවර, රත්නපුර, කෑගල්ල හා ගාල්ල යන කලාප 06 ක මාස 06 ක් තුළ නිමකළ යුතු නිවාස ඒකක 211 කින් 33 ක් පමණක් සම්පූර්ණ කර තිබූ අතර එය නිමකිරීමේ ප්‍රගතියෙන් සියයට 15.6ක අවම මට්ටමකි.මෙම නිවාස ඒකක සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.114,088,522 න් රු.76,759,144 ක් පමණක් 2020 දෙසැම්බර් 31 දින වන විට වැය කර සියයට 67 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඇ) 2018 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද හැටන්,නුවරඑළිය,මහනුවර යන කලාප 03 හි නිවාස ඒකක 205 කින් කිසිදු නිවසක් නිමකර නොතිබූ අතර ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රගතිය ශුන්‍ය වුවද ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.144,429,002 න් රු.72,810,466 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන | -එම- | -එම- |

| | | |
|---|---|---|
| විට වියදම් කර සියයට 50 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. නිවාස ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අරමුදල් උපයෝජනය කිරීමේ සඵලදායී බවක් නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | |
| (ඇ) 2017, 2018 හා 2019 වර්ෂයන්හි දී ආරම්භ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති 120ක් අතුරින් 2020 දෙසැම්බර් 31 දිනට නිමකළ ප්‍රමාණය 75ක් පමණක් වූ අතර ව්‍යාපෘති 45ක වැඩ කටයුතු නිමකර නොතිබුණි. | | -එම- |

**3.7 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

----------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය යටතේ නව නිවාස 150ක් ඉදිකිරීම් වැඩසටහන යටතේ ෆෝර්ඩීස් වතුයායේ නිවාස ඒකක 19ක් ඉදිකිරීම සඳහා කිසිදු කාර්යයන් ආරම්භකර නොතිබියදී 2020 දෙසැම්බර් 31 දිනට රු.570,000 ක් කළමනාකරණ ගාස්තු ලෙස වැවිලි මානව සංවර්ධනභාරය වෙත ගෙවීම් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාල ව්‍යාපෘති සම්බන්ධ ගෙවීම් නිසි අධීක්ෂණයකින් හා පාලනයකින් යුතුව කල යුතුය. |

**3.8 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා රු.මිලියනයක් වැයකර ඇති බව වාර්ෂික කාර්යයසාධන වාර්තාවෙහි දක්වා තිබුණද 2020 වර්ෂයේ ප්‍රගති වාර්තාවට අනුව තත්‍ය වියදම රු.මිලියන 33.16ක් විය. | කාර්ය සාධන වාර්ථාවේ පරිගණක ගත කිරීමේ දී සිදුවන ප්‍රමාද දෝශයක් නිසා මිලියනයක් ලෙස සටහන් වී ඇති අතර එය මිලියන 33.16 ලෙසට නිවැරදි විය යුතු වේ. | අදාල තොරතුරු නිවැරදි ලෙස ඉදිරිපත් කල යුතුය. |
| (ආ) අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMEHCI/2/3/17 හා 2021 ජනවාරි 25 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 295ක් වුවද වාර්ෂික කාර්යයසාධන වාර්තාවට අනුව 288ක් බව දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | -එම- |

**3.9 විදේශ ආධාර ව්‍යාපෘති**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉන්දියානු රජයේ ආධාර ඇතිව ඉදිකරනු ලබන නිවාස ඒකක 4000 ව්‍යාපෘතිය වසර තුනක කාලයක් ඇතුළත නිමකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වසර පහකට ආසන්න කාලයක් ගත වී තිබුණද අදියර 1 හා 11 යටතේ සම්පූර්ණ කළ නිවාස ගණන 3576ක් පමණක් විය. ඉන් ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කර තිබූ නිවාස ගණන 699කි. තවද නිවාස ඒකක 83ක කටයුතු ආරම්භ කිරීමෙන් තොරව පැවතුණි. | පිළිගනිමි.<br><br>නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් වෙන් කර ගැනීමේ ගැටලු හේතුවෙන් ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රමාදවිය. | විදේශ ආධාර ව්‍යාපෘති උපරිම කාර්යක්ෂමතාවයකින් අදාල කාලය තුල සම්පූර්ණ කර ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ආ) උක්ත නිවාස ව්‍යාපෘතියෙහි දෙවන අදියරෙහි පළමු කොටසේ නිවාස 5000ක් වෙනුවෙන් කළමනාකරණ ගාස්තු ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර 2019 වර්ෂයේදී රු.මි.10ක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණද 2020 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි | පළමු අදියර යටතේ ඉදිකරනු ලබන නිවාස ඒකක 4000ට අදාළව සියලු යටිතල පහසුකම් ද සම්පූර්ණ කර, එම නිවාස ප්‍රතිලාභීන් වෙත භාර දීමට හැකි අයුරින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ද සමග ඉදිකිරීම් 2021.09.30 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. | -එම- |

**3.10 ප්‍රසම්පාදනයන්**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 31 වන දින ගෙවීම් කර තිබූ රු.2,982,000 ක් වටිනාකමැති මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් හා එක්ස්ටෙන්ෂන් පවර්කෝඩ් උපකරණ, 2020 ඔක්තොම්බර් 20 දින අමාත්‍යාංශයට ලැබිය යුතු වුවත් එම උපකරණ 2020 නොවැම්බර් 18 වන දින ලැබී තිබූ බව නිරීක්ෂණය විය. | අතුරු සම්මත ගිණුම මඟින් ලබා දී තිබූ ප්‍රතිපාදන අදාළ කාලසීමාව තුළ අවසන් වන නිසා එම මිලදී ගැනීම සඳහා චෙක්පත කලින් සකස් කිරීමට සිදු විය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු. 10,733,750 ක පරිගණක උපකරණ මිලදී ගැනීම සඳහා 2020 අගෝස්තු 30 වන දින ඇනවුමක් ප්‍රදානය කර ඇතත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 8.9.3 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සැපයුම්කරු සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 ප්‍රකාරව එම ගෙවීම් කිරීමට පෙර ඒවා පිරිවිතරවලට සහ එකඟ වූ නියමයන්ට අනුකූල බවට ස්ථානභාර නිලධාරයා විසින් සහතිකයක් නිකුත් කළ යුතු වුව ද එසේ කටයුතු කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | පිළිගනිමි.ඉදිරියේදී එසේ සිදු නොවන මෙන් කටයුතු කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | -එම- |
| (ඇ) | ලංසු ලේඛනවල අඩංගු කොන්දේසි අනුව ගෙවීම් කරනු ලබන්නේ අදාළ උපකරණ අමාත්‍යාංශයට ලැබුණු පසුව වුවද , i5 Desktop Computer , UPS හා Wireless printers සඳහා රු 11,695,366 ක් 2020 අගෝස්තු 31 වන දින ගෙවීම් කර ඇති නමුත් මෙම උපකරණ අමාත්‍යාංශයට ලැබී තිබුණේ 2020 නොවැම්බර් 30 දින සිට 2021 ජනවාරි 12 වන දින අතර කාලයේ දී බව නිරීක්ෂණය විය. | මෙම කාලය වනවිට කොරෝනා වසංගත තත්ත්වය ලෝකය පුරා ව්‍යාප්තව පැවතුණද භාණ්ඩ ප්‍රවාහනය සිදු විය. අදාල නැව භාණ්ඩ සමඟ නැවත හරවා යැවීමක් සිදු වීම නිසා අදාල භාණ්ඩ ලැබීම ප්‍රමාද වූ බව දැනුම් දෙමි. | -එම- |

**3.11 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තොණ්ඩමන් අනුස්මරණ පදනම යටතේ එකතුව රු.399,000ක් වටිනා අංක BBN 9715 හා අංක BDK 5469 දරණ යතුරු පැදි 02ක් 2020 වර්ෂය අවසානය දක්වාම නිෂ්කාර්යව පැවති අතර ඉන් BBN 9715 දරණ යතුරු පැදිය නිවාස අමාත්‍යාංශයට ලබා දී ඇති බව වාචිකව ප්‍රකාශ කර තිබුණි. ඊට අදාළ ලිඛිත සාක්ෂි හා 2019 හා 2020 වර්ෂයන්ගේ ධාවන සටහන් ද විගණනයට ඉදිරිපත් නොවුණි. | සේවා අවශ්‍යතාවය මත යතුරුපැදිය අනුයුක්ත කල රියදුරු අප අමාත්‍යාංශයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත තාවකාලිකව අනුයුක්ත කල අතර පවති කොරෝනා වසංගත තත්ත්වය මත රාජකාරී ඉටු කිරීමට මෙම යතුරුපැදිය එම රියදුරු වෙත ලබාදී තිබුණි. මෙය ලේකම්තුමාගේ උපදෙස්මත ලබාදී තිබුණි.මෙම යතුරුපැදි සඳහා කිසිදු අවස්ථාවක ඉන්ධන නොසපයන බැවින් ධාවන සටහන් ලබා දී නැත. | අමාත්‍යාංශය සතු වාහන උපරිම කාර්යක්ෂමතාවය කින් භාවිතා කිරීමටත් අදාල තත්‍ය විස්තර ඉදිරිපත් කිරීමටත් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | PA - 1442 දරන මිට්සුබිෂු කැබ් රථය සඳහා 2017 වර්ෂයේ සිට 2020 දක්වා රු.1,679,213 ක් නඩත්තු වියදම් දරා තිබූ නමුත් 2020 වර්ෂයේ මාස 10 කට වඩා කාලයක් නිෂ්කාර්යව පැවති අතර අළුත්වැඩියාවන් නිසි අධීක්ෂණයකින් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂය මාර්තු මාසයට පෙර අලුත්වැඩියා කටයුතු සඳහා දේශීය නියෝජිත ආයතනය වන යුනයිටඩ් මෝටර්ස් වෙත යොමු කර තිබූ අතර පවතින කොරෝනා වසංගත තත්වය මත එම ආයතනය පුරා මාස 02 කට වැඩි කාලයක් වසා තැබීමත් මෙම නියෝජිත ආයතන විසින් අමතර කොටස් නොමැති බවත් දන්වා සිටින ලදී. පසුව දෙවන හා තෙවන කොරෝනා රැලි පැමිණීමත් සමග එම ආයතනය වැඩ කටයුතු තව තවත් අඩාල විය. කෙසේවෙතත් මේ වන විට එම වාහනයේ එන්ජිම අල්ත්වැඩියා සඳහා එදිරිසිංහ සහෝදරයෝ වෙත යොමු කර ඇත. | වාහන අළුත්වැඩියා නිසි අධීක්ෂණයකින් යුතුව සිදුකර එම වාහන වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | අංක NC-9910 දරණ රථය සෙන්ට්‍රල් ෆිනෑන්ස් ආයතනයෙන් මෙහෙයුම් කල්බදු ගිවිසුම යටතේ වසර 05කට මාසික වාරිකය රු.199,293 බැගින් අවම වශයෙන් කිලෝමීටර 3000ක් ධාවනය කිරීමේ පදනම මත ලබාගෙන තිබුණි. ඉදිරිපත් වූ තොරතුරු අනුව මාස 09 ක් සඳහා කිලෝමීටර් 27,000 ක් ධාවනය කල යුතු වුවත් කිලෝමීටර් 9,822 ක් අඩුවෙන් ධාවනය කර තිබුණි. | අංක NC – 9910 දරණ වෑන් රථය ගිවිසුම අනුව ධාවනය කලයුතු උපරිම කිලෝමීටර් ගණන කි .මී.3000 කි. | අදාල වාහන උපරිම කාර්යක්ෂමතාවය කින් භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අමාත්‍යාංශය සතු වාහන 04 ක් වෙනත් අමාත්‍යාංශ සඳහාද, තවත් වාහන 04 ක් මෙම අමාත්‍යාංශය යටතේම පවතින වෙනත් ආයතන සඳහාත් තවත් වාහන 04 ක් වැව්ලි මානව සංවර්ධන භාරයටද නිදහස් කර තිබුණි. | අමාත්‍යාංශ විෂය පථය වෙනස් වීම මත පුනුරුත්තාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙතින් ලද වාහන 04ක් නැවතත් එම අමාත්‍යාංශය වෙත ලබාදුන් අතර, තාවකාලිකව සේවා අවශ්‍යතාවය මත මෙමෙ අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතන සඳහා තවත් වාහන 04ක් ලබාදී ඇත. අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති වල අධීක්ෂණ කටයුතු සඳහා අමාත්‍යාංශය යටතේ පවතින, වැවිලි මානව සංවර්ධන භාරය වෙත වාහන 04 ක් තාවකාලිකව නිදහස් කර තිබුණද, මේ වන විට ඉන් වාහන 03ක් නැවතත් අමාත්‍යාංශය වෙත ලබාගෙන ඇත. | අදාල වාහන අමාත්‍යාංශය තුල උපරිම කාර්යක්ෂමතාවය කින් භාවිතා කිරීමට හෝ විධිමත්ව පවරාදීමට කටයුතු කල යුතුය. |

## 3.12 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී/ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශ සමඟ වූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (සටහන i) වර්ෂය තුල සිදු වූ පාඩු හා හානි පිළිබඳ වාර්තා කල යුතු වුවත් ප්‍රවර්තන වර්ෂය තුල සිදු වී තිබූ රු.1,679,168 ක අලාභය සම්බන්ධයෙන් සටහන් ඇතුලත් කර නොතිබුණි. | පිළිගනිමි.<br><br>නිවැරදි කිරීමට සටහන් කර ගතිමි | අදාල සටහන් නිසිපරිදි ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.13 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක් එක් කොන්ත්‍රාත් වැඩ වලින් කළමනාකරණ ගාස්තු ලෙස සියයට 4 ක් හා සියයට 4.5 ක් වූ ප්‍රතිශතයන් නිසි අධිකාරීත්වය පිළිබඳ සැලකිල්ලකින් තොරව පීඑච්ඩීටී ආයතනය වෙත ගෙවා තිබුණි. | හිටපු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීමකදී 4% ක් සහ 4.5%ක් වශයෙන් යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා කළමනාකරණ ගාස්තු ගෙවීම පිළිබඳ සාකච්ඡා කොට නිගමනය කර ඇත. ඒ අනුව රු. මිලියනට වැඩි පිරිවැයක් සහිත ව්‍යාපෘති සඳහා 4%ක් ද රු. මිලියනයට අඩු පිරිවැයක් සහිත ව්‍යාපෘති සඳහා 4.5% ක් ද ගෙවීමට තීරණය කර ඇත. | නිසි අධිකාරීත්වයක් ලවා ගෙවීම් කල යුතුය. |

## 3.14 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු.රෙ.756 ප්‍රකාරව 2020 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා සමීක්ෂණ වාර්තා 2021 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම පිළිබඳ සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය. 2019 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2021 ජනවාරි 27 දින දී ය. | පිළිතුර ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් හදුනාගෙන තිබූ තිරසාර සංවර්ධන අරමුණු 04ක් යටතේ ඊට අදාළව ඉලක්ක වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් වැඩසටහන් 05ක් සම්බන්ධයෙන් අපේක්ෂිත නිමවුම් මට්ටම සියයට 1.8 සිට සියයට 48.13ක අවම මට්ටමක පැවතුණි. | අතුරු සම්මත ගිණුම් යටතේ මුලා කටයුතු සිදු වීම හේතුවෙන්, ප්‍රතිපාදන පිළිබඳ ප්‍රරෝකථනය කිරීම අපහසු වීමත්, ඇතැම් සැලසුම් කරන ලද ඉදිකිරීම් පැවති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ ප්‍රමාදවීමත් නිසා අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කර ගත නොහැකි විය. | තිරසාර සංවර්ධන අරමුණු ලගා කර ගැනීම සඳහා උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව කටයුතු කර අපේක්ෂිත නිමැවුම් මට්ටම උපරිමයෙන් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 134(2) ප්‍රකාරව මුදල් කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර තිබුණේ 2020 ජනවාරි 01 සිට 2020 අප්‍රේල් 30 දක්වා පමණක් වන අතර සමස්ත වර්ෂය සඳහාම යාවත්කාලීන කර නොතිබුණි. | වසරේ මුල් මාස 4 සඳහා පමණක් අයවැය අතුරු සම්මත ගිනුමකින් වෙන්වූ ප්‍රතිපාදන මත අදාල විගණන සැලැස්ම පිළියල කරන ලදී. නමුත් 2020 වසරේ මාර්තු මස සිට කොරෝනා වසංගතය පැවති අතර එමනිසා කාර්යාල කටයුතු වලට වූ බාධා නිසා මෙය යාවත්කාලීන කිරිමට නොහැකි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 324ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 295ක් වූයෙන් සේවකයින් 40ක් සම්බන්ධයෙන් පුරප්පාඩුව පැවතුණි.ඒ අතරින් ජ්‍යෙෂ්ඨ | ජ්‍යෙෂ්ඨ විධායක සහ විධායක මට්ටමේ තනතුරු 9 දීප ව්‍යාප්ත සේවා වලට අයත් වන අතර මෙම තනතුර සඳහා බඳවා ගැනීම අමාත්‍යාංශ මට්ටමෙන් සිදු කල නොහැකි අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස පත්වීම් බලධාරීන් වන රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් | අවශ්‍යතා සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු ඉක්මණින්ම පුරවා අමාත්‍යාංශයේ |

| | | | |
|---|---|---|---|
| | මට්ටමේ තනතුරු 09ක් ප්‍රධාන වශයෙන් සම්පූර්ණ කිරීමෙන් තොරව පැවතුණි. | නිරන්තරයෙන් ඉල්ලීම් කරනු ලබයි. | කටයුතු ක්‍රමවත්ව ඉටු කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අනුමත සේවක සංඛ්‍යාව වැඩිකර ගැනීමෙන් තොරව ප්‍රාථමික මට්ටමේ රියදුරු හා කාර්යාල කාර්ය සහායක තනතුරු 08ක අතිරික්තකාවයක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රාථමික මට්ටමේ තනතුරු 03ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන කැබිනට් අමාත්‍යාංශය සඳහා අනුමතව පැවති කාර්යමණ්ඩලය, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ලෙස වෙනස් කිරීමේදී කළමණාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල් විසින් අඩු කර ඇත. එහෙත් අනුමත කර ඇති රියදුරු කාර්යමණ්ඩලය සහ කාර්යාල සේවක සේවා ප්‍රමාණවත් නොවන බැවින් එම සංඛ්‍යාව වැඩිකරන ලෙස කළමනාකරණ අධ්‍යක්ෂක ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇත.<br><br>අමාත්‍යාංශයට අවශ්‍ය කාර්යාල සේවක සේවයේ සහ රියදුරු සේවයන්ට අදාළ කාර්ය මණ්ඩලය බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙන් වෙතින් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව විමසන ලෙස කළමණාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දී ඇත. මේ අනුව අතිරික්ත වශයෙන් පෙන්නුම් කර ඇති තනතුරු සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහා වර්ථමානයේදී කටයුතු කරමින් පවතී.<br><br>ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින තනතුරු 03 තාවකාලික පදනම මත අනුමත කර ඇත. | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව මත පදනම්ව පුරප්පාඩු පිරවීමටත් අතිරික්තය අනුමත කර ගැනීමට තටයුතු කල යුතුය. |